# ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාර බිතුසිතුවම් මඟින් නිරූපිත ජල යාත්‍රා සලකුණු

**ඩබ්.එච්.ආර්. ප්‍රියන්දන**
මුහුදු පුරාවිද්‍යා ඒකකය, මධ්‍යම සංස්කෘතික අරමුදල, ගාල්ල.
priyandana@gmail.com

ප්‍රමුඛ පද: ජල යාත්‍රා, මහනුවර සම්ප්‍රදාය, රුවල් නැව්, විහාර බිතුසිතුවම්

## හැඳින්වීම

මහා සම්ප්‍රදායේ හා චූල සම්ප්‍රදායේ සිතුවම් මගින් හඳුනාගත හැකි ජල යාත්‍රා සළකුණු ප්‍රධාන කොට මෙම අධ්‍යයනයට සිදුකරන ලදි. පර්යේෂණ ගැටලුව වන්නේ විහාර බිතුසිතුවමින් නිරූපිත ජල යාත්‍රා හී ස්වරූපය කොබඳු ද යන්නයි. දීර්ඝ කාලයක් තිස්සේ මෙරට සිදුවූ නාවුක ගමනාගමනයන් පිළිබඳව තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රයන්හී සඳහන්ව ඇත. නමුත් යාත්‍රා නිර්මාණකරණය පිළිබඳව ඇත්තේ අල්ප වූ තොරතුරු ප්‍රමාණයකි. තිවංක පිළිමගෙයි මාතුපෝෂක ජාතක කතා වස්තුව දැක්වෙන අවස්ථාවේ නිරූපිත යාත්‍රා සලකුණ විහාර බිතුසිතුවමක හමුවන පැරණිම සාධකයයි. ඉන් හැරුණු කොට හමුවන්නේ මහනුවර සම්ප්‍රදායේ සිතුවම් තුළ ය. නැකැත් හා ලග්න රූප සිත්තම් කර සිවිලිම අලංකාර කිරීමේදී හා ජාතක කතා තුළ මෙවැනි ජල යාත්‍රා සළකුණු හැඳිනිය හැක. කළුතර දොඩන්ගොඩ සුදර්ශනාරාමය, කළුතර අශෝකාරාමය, දොඩන්දූව ශෛලබිම්බාරාමය, ගාල්ල ගංගාරාම විහාරය, කතළුව පූර්වාරාමය, කතළුව රන්වැල්ල විහාරය, එවැනි ජල යාත්‍රා සළකුණු සහිත විහාරස්ථාන කිහිපයක් පමණි. අපරදිග ජාතීන් විසින් භාවිත කරනලද ජල යාත්‍රා මේවායෙන් නිරූපිත ය. මෙරට අවසාන සාම්ප්‍රදායික නෞකාව නිර්මාණය කරන ලද්දේ දොඩන්දූවේ ය. ඒ දොඩන්දූව යාත්‍රා ද්‍රෝණියයි. 1940 දශකය දක්වාම මෙම යාත්‍රා විශේෂය භාවිත වූ බවට සාධක තිබේ. මහනුවර සම්ප්‍රධායේ විහාර සිත්තරුන් විශාල යාත්‍රා නිරූපනයේදී බටහිර ජාතීන් විසින් භාවිත කරන ලද වාෂ්ප නෞකා මෙන්ම යුධ රුවල් නෞකා පමණක් භාවිතයට ගත්හ.

## ක්‍රමවේදය


විහාර බිතුසිතුවම් අතර දක්නට ඇති ජල යාත්‍රා සළකුණු අධ්‍යනය කිරීමේ දී මා විසින් ප්‍රධාන කොට ක්‍රමවේදකිහිපයක් අනුගමනය කරන ලදී. සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් හමුවන යාත්‍රා පිළිබද තෙරතුරු අධ්‍යනය, විහාරස්ථාන වෙත ගොස් එවායේ සිත්තම් කරන ලද ජල යාත්‍රා ඡායාරූප හා වීඩියෝ මාර්ගයෙන්

වාර්තාගත කිරීම, ඡායාරූප මාර්ගයෙන් ජලයාත්‍රා හී සැළසුම් නිර්මාණය කිරීම ප්‍රධාන ක්‍රමවේදයන් ලෙසින් භාවිත කරන ලදී. මෙරට භාවිත කරන ලද සාම්ප්‍රධායික ජල යාත්‍රා හා විදේශිකයින්ගේ ජල යාත්‍රා අතර වෙනස පිළිබඳ ව අධ්‍යනය කර ඒ ඔස්සේ මෙම පර්යේෂණය සිදුකරනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අනුරාධ පුර අවධියේ සිතුවම් තුළයාත්‍රා නිර්මාණය කිරීම පිළිබඳ සාධක සොයාගත නොහැක. නමුත් සාහිත්‍ය මූලාශ්‍රයන් හී සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් දී යාත්‍රා භාවිතය පිළිබඳ ව සඳහන් වන තොරතුරු බොහෝ ය. දේවානම්පිය තිස්ස රජු චූලංගන, මහාංගන, සිරිවඩ්ඪන යැයි මන්දිර තුනක් කරවා ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවාලූ නැවේ කුඹය, කෙනිපතය හා පළපත ප්‍රදර්ශනය කල බව සඳහන් ය. (මහාවංශය: 19, 68-70) ලොව සමුද්‍ර කෞතුකාගාර සංකල්පය පිළිබඳ සඳහන් පළමු සිදුවීම මෙයයි. අනුරාධපුර ඇතුලුනුවර රොබින් කනින්හැම් ඇතුළු කණ්ඩායම විසින් සිදුකරන ලද කැනීමකින් හමු වූ මැටි බඳුන් කැබැල්ලක ද යාත්‍රාවක සළකුණකි. මෙහි කුඹ ගස මෙන් ම රුවලද පැහැදිලි ව හඳුනා ගැනීමේ හැකියාව පවතී. දුවේගල සෙල් ලිපියේ නාවික ප්‍රධානියකුගේ මුද්‍රාවක් නිරූපණය කර ඇත. එහි සඳහන් වන "ශගරබිතශ" යන නාමය සංඝ රක්ඛිත ලෙස පරණවිතාන අර්ථ දක්වූව ද බොහෝ විද්වත් මතය වනුයේ " සාගරකිත්ති" හෙවත් සාගරයේ සේවයේ නියුතු යන්න වන බවයි. මෙහි පැහැදිලි ව නෞකාවක රූප සටහනක් දක්වා තිබෙන අතර කුඹ ගසක් හා රුවලක සලකුණු ද හඳුනාගත හැකි ය. අකුරුගොඩ ප්‍රදේශයේ සිදුකරන ලද කැනීමක දී මැටිබඳුන් කැබැල්ලක තිබී නැවක සළකුණක් හමු වී ඇත. මෙය ක්‍රිස්තු වර්ෂ 4වැනි සියවට පමණ අයත් බව කාළනිර්ණ කර ඇත. හමු වූ මැටිබඳුන් කැබැල්ලේ යාත්‍රාවේ තට්ටුව, ඇණිය, අවර, කුඹගස මෙන් ම රුවල් ද දක්වා ඇත. විහාර බිතුසිතුවමක යාත්‍රාවක සළකුණක් හමු වන්නේ පොළොන්නරුවේ තිවංක පිළිම ගෙයින් ය. (Devendra 1995:217). මෙම සිතුවම වර්තමානය වන විට මැකී ගොසිනි. නමුත් එහි පිටපතක් දැනට කොළඹ කෞතුකාගාරයේ සිතුවම් මැදිරියේ ප්‍රදර්ශනය කරනු ලබයි. එම සිතුවමේ බුදුරජාණන් වහන්සේ පාරුව වර්ගයේ යාත්‍රාවක භූමි ස්පර්ෂ මුද්‍රාවෙන් වැඩ සිටී. දෙපස පුද්ගලයන් දෙදෙනෙක් හබල් දෙකක් ආධාරයෙන් යාත්‍රාව පදවනු දැකිය හැකි ය.

මහනුවර නාථ දේවාලය අසල වම් පසින් ඇති සූනියම් දේවාලයේ වම්පස පිටත බිත්තියේ අඳිනලද පැරණි සිතුවමකි. එහි ඇතෙකුගේ පිටෙහි වන ඇත් ගොව්වකු නිරූපිතය. මෙම ඇත් රූපය කටුවකින් සූරා පැරණි සිතුවම් විකෘති කර නිර්මාණය කරන ලද රුවල් නැව් ත්‍රිත්වයකි. බොහෝ දෙනාගේ මතය වන්නේ මෙම සිතුවම් පෘතුගීසි සොල්දාදුවකු විසින් නිර්මාණය කරන්නට ඇති බවයි. එක් රුවල් නෞකාවක දක්නට තිබෙනුයේ එක් කුඹයක් පමණි. අනෙක් නෞකා දෙකේම කුඹ ගස් දෙක බැගින් දක්නට ලැබේ. නිර්මාණය කර තිබෙන යාත්‍රා ත්‍රිත්වයම යුධ යාත්‍රාවන්ය.



මෙරට විවිධ ස්ථානයන් හී ජල යාත්‍රා නිරූපිත ආකාරය

පහතරට විහාර සිවිලිම් සිතුවම් කිරීමේ දී ලග්න රූ නිරූපනය සාමාන්‍ය ක්‍රියාවලියකි. කන්‍යා ලග්නයේ නිරූපිත කාන්තාව සෑම විහාරස්ථානයක ම සිතුවම් කර ඇත්තේ රුවල් යාත්‍රාවක ය. කන්‍යා රුවට ආවේණික ලක්ෂණ කිහිපයකි. ඇගේ එක් අතක ඇල් වී මිටක් ද

තවත් අතක පහනක රූපයක් ද වන අතර ඇය නිතර ම සිටිනුයේ ජල යාත්‍රාවක ය. එහිදී සෑම විහාරයක ම ශිල්පීන් විදේශීය යාත්‍රා දැක්වීම කැපී පෙනේ. ශෛලබිම්බාරාම ශිල්පියා කන්‍යා ලග්නය සිතුවම් කිරීමේ දී දක්වන්නේ කුඹ ගස් තුනකින් යුත් රුවල් යාත්‍රාවක් දක්වයි. එහි යාත්‍රාවේ පෙර බඳේ සිට දිවෙන ලීය (Bowsprit) මනා කොට දක්වයි. කළුතර අශෝකාරාමය, දොඩන්ගොඩ සුදර්ශනාරාමය, මහ බෙල්ලන සුධර්මාරාමය මෙලෙසින් කන්‍යා ලග්නයේ සිතුවම් නිර්මාණයේ දීයාත්‍රා භාවිත කරන ලද විහාරස්ථාන කිහිපයක් පමණි.

ශෛල බිම්බාරාමයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩමවීම දක්වන සිතුවමේ රුවල් යාත්‍රා දෙකක් සිතුවමට නගා තිබේ. අශෝක මහ රජු ශ්‍රී මහා බෝධීන් වහන්සේ උත්සවශ්‍රීයෙන් පෙරහැරකින් රුවල් නෞකාවට වැඩම කරලීමත් පසු ව මෙරට දඹකොළ පටුන වරායේ දී දේවානම්පියතිස්ස රජු විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිළිගැනීම යන අවස්ථා දෙක සඳහා ශිල්පියා රුවල් යාත්‍රා දෙකක් දක්වයි. මෙකී රුවල් යාත්‍රා දෙකම යුධ යාත්‍රාවන් ය. එහි කාලතුවක්කු දක්වා නොතිබුණ ද කාලතුවක්කු රඳවන කුවීර දක්වා ඇත. උක්ත යාත්‍රා දෙක දෙස බැලීමේ දී ශිල්පියා සතුව පැවතියා වූ යාත්‍රා පිළිබඳ දැනුම මනාකොට අවබෝධ කරගත හැකි වේ. සාමාන්‍යයෙන් රුවල් යාත්‍රාවක දැකිය හැකි තාක්ෂණික උපාංගයන් බොහොමයක් යාත්‍රාවේ නිරූපනය කර ඇත. නන්දිය උපාසක ගේ කතා වස්තු දක්වන අවස්ථාවේ නිරූපිත සිත්තමේ ද නන්දිය උපාසක දක්වා තිබෙන්නේ රුවල් යාත්‍රාවකය (ප්‍රියන්දන 2012:6).

කතළුව පූර්වාරාමයේ ද රුවල් යාත්‍රා දෙකක් නිරූපිතය. නන්දිය උපාසක කතාවස්තුව දැක්වෙන අවස්ථාවේ හා පටාචාරා කතාවස්තුව නිරූපිත අවස්ථාවේ සිතුවම්කර ඇත. එක් නෞකාවක් රුවල් භාවිතයෙන් නිමවා තිබෙන අතර අනෙක් නෞකාව රුවල් හා වාෂ්ප බලයෙන් ධාවනය වන ආකාරයට නිමවා ඇත. මෙහි funnel (දුම් බට) දෙකකි. ඉන් දුම් අහසට නිකුත්වන ආකාරය ද සිතුවමට නගයි. මේ ආකාරයට ම කතළුව රන්වැල්ල පුරාණ විහාර මහෞෂධ පඬිතුමාගේ කතා වස්තුව දැක්වෙන අවස්ථාවේ ඉහත ආකාරයේ ම යාත්‍රාවකි. මෙහි දක්වා ඇත්තේ එක් දුම් බටයක් පමණි. පානදුර රන්කොත් විහාරයේ මහා ජනක ජාතක කතා වස්තුව නිරූපිත සිතුවමේ රුවල් යාත්‍රාවක් සිතුවම් කර ඇත. එහි නැව සම්පූර්ණයෙන් ම දක්වා නොමැති වුව ද කුඹ ගස් දෙකක් සිත්තම් කර ඇත.

මෙරට නිර්මාණය වූ අවසාන විශාල යාත්‍රාව ලෙස සැලකෙන්නේ දොඩන්දූව යාත්‍රා දෝණියයි. දොඩන්දූව යාත්‍රා දෝණිය මගින් දොඩන්දූවේ සිට දකුණු ඉන්දියාව දක්වා ජාඩි ප්‍රවාහනය සිදුකරන ලදී. මෙරට වරායන් අතර භාණ්ඩ හුවමාරුව මෙන් ම මගී ගමනාගමනය

ද සිදුකර ඇත. මෙම යාත්‍රාව 20 වන සියවස මැද භාගය දක්වාම භාවිත කරන ලද බව සාධක හමු වේ.

මුල්කාලීන යාත්‍රා සිත්තම් කිරීමේ දී දේශීය ආකෘයෙන් යුතු යාත්‍රා විහාර බිතුසිතුවම් සඳහා සොදාගත්ත ද මහනුවර සම්ප්‍රදායේ දී අපරදිග ජාතීන්ගේ ආභාෂය ලැබෙන්නට විය. පැරණි සිත්තරා ඔරු නිර්මාණය කිරීමේදී සාම්ප්‍රදායික රුවල් ඔරුව චිත්‍රයට නැගුව ද විශාල යාත්‍රා නිර්මාණය කිරීමේ දී ආකෘතිය කොට ගත්තේ විදේශීය යාත්‍රාවන් ය. පහතරට ශිල්පීන් කුඹගස් සහිත රුවල් නෞකා බහුලව භාවිත කර ඇත. මෙසේ භාවිත කරන ලද සෑම යාත්‍රාවක්ම විදේශිකයන් විසින් නිර්මාණය කරන ලද යාත්‍රා ය. කෝට්ටේ යුගයෙන් පසු මෙරට බටහිර ජාතීන්ට යටත් වීමත් සමඟ මෙරට නෞකා නිර්මාණය නොවූ අතර ලංකාවේ සෑම නාවුක ගමනාගමනයක් ම සිදුවූයේ විදේශිකයන් හරහා ය. මහනුවර සම්ප්‍රදායේ පහතරට සිතුවම් ශෛලිය බෙහෙවින් ජනප්‍රිය වන්නට පටන්ගත්තේ 1815න් පසුව ය. පහතරට කලාපයේ නිර්මාණය වූ බොහෝ සිතුවම් බ්‍රිතාන්‍ය පාලන සමය තුළඉදිවිය. මෙම අවධියේ ශිල්පීන් හට දක්නට ලැබුණේ විදේශිකයන් විසින් භාවිත කරනු ලැබූ යුධ හා වෙළෙඳ නැව් බැවින් ජාතක කතා හා නැකැත් රූ දැක්වීමේ දී විදේශීය යාත්‍රා යොදා ගත්හ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ප්‍රියන්දන, රුක්ෂාන් (2012) දළනිදු, වෙළුම 04, කාණ්ඩය 02, අප්‍රේල් (සංස්. රසික මුතුකුමාරණ), දොඩන්දූව ශෛලබිම්බාරාම විහාර බිතුසිතුවමින් නිරූපිත ජල යාත්‍රා සලකුණු, මුහුදු පුරාවිද්‍යා ඒකකය, මධ්‍යම සංස්කෘතික අරමුදල, ගාල්ල.

මහාවංශය(2004) (සංස්) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල,

Devendra, Somasiri (1995) Sesquicentennial Commemorative Volume of the Royal Asiatic Society of Sri Lanka 1845-1995, PREMODERN SRI LANKAN WATERCRAFT: THE TWIN. HUTLED LOGBOATS Royal Asiatic Society.